සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/07 අතරුදි | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2025.11.04

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂක /සහකාර අධ්‍යක්ෂකවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු / පාලක මණ්ඩල සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති / බැංකු කළමනාකරුවන්.

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු, සමෘද්ධී ප්‍රජාමූල බැංකු සමිති, ක්ෂේත්‍රයේ රාජකාරි කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා අතරුදි මුදල් රක්ෂණ වැඩසටහන හා බැංකු කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන සහ මුදල් සේප්පු සඳහා රක්ෂණ ආවරණ ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

උක්ත කරුණට අදාලව 2021.11.23 දින නිකුත් කරන ලද 2021/19 අංක දරණ චක්‍රලේඛය හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ආරක්ෂාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛ/ උපදෙස් ලිපි හා බැඳේ.

- 2008.08.02 දිනැති මෙහෙයුම් උපදෙස් පත්‍රිකා චක්‍රලේඛ ලිපි අංක 36.
- 2016.02.25 දිනැති චක්‍රලේඛ අංක 2016/02
- 2023.10.03 දිනැති චක්‍රලේඛ අංක 2023/08

02. ඉහත සඳහන් 2021/19 චක්‍රලේඛය මඟින් අතරුදි මුදල් හා සේප්පු රක්ෂණ වන්දි ගෙවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර එහි 10.1.6 වගන්තියට අනුව “ චක්‍රලේඛ උපදෙස් නොතකා කටයුතු කිරීම හේතුවෙන් මුදලේ ආරක්ෂාව බිඳවැටී මුදලට කිසියම් හානියක් සිදුවුවහොත්, පරීක්ෂණ මඟින් එම කරුණු තහවුරු වූ විට කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය තම පෞද්ගලික මුදලින් ඒ සඳහා වන්දි ගෙවිය යුතුය.” යන්න සඳහන් කර ඇත.

03. නමුත් බොහෝමයක් අවස්ථාවල සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති එම උපදෙස් අනුගමනය නොකරන බව දක්නට ලැබේ. ඒ හේතුවෙන් මෑත කාලීනව සොරකම් කිරීම් හා මංකොල්ලකෑම් වැනි සිද්ධි වැඩිවීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත. මෙම තත්ත්වය වන්දී ගෙවීම් සම්බන්ධ තීරණ ගැනීමේදීද ගැටළුකාරී තත්ත්වයක් බවට පත්ව ඇත.

04. එලෙස ඇති වූ ගැටළුකාරී සිද්ධියකට අදාළව අතරුදි හා සේප්පු වන්දි ගෙවීම සඳහා තීරණය කිරීම වෙනුවෙන් 2025.09.11 දින පවත්වන ලද කමිටු රැස්වීම් වාර්තාවෙහි “සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ආරක්ෂාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් පිළිපැදීම අනිවාර්ය බව දන්වමින් උපදෙස් ලිපියක් නිකුත් කලයුතු බව.” ට සඳහන් කර ඇත.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

05. එබැවින් මින් ඉදිරියට අදාළ වන්දි මුදල් ඉල්ලුම් කිරීමේදී, වාරික මුදල් ගෙවා නිසි පරිදි රක්ෂණ ආවරණ ලබා ගැනීම මෙන්ම, ඉහත චක්‍රලේඛ හා ලිපි වල සඳහන් ආරක්ෂාව සම්බන්ධයෙන් වූ උපදෙස් අනුගමනය කර තිබීමද අනිවාර්ය වේ.

06. ඒ අනුව දී ඇති උපදෙස් වලට පටහැනි ලෙස ක්‍රියා කිරීම හේතුවෙන් ආරක්ෂාව බිඳවැටී ඇති බව අනාවරණය වුවහොත් ඒ සඳහා වගකිවයුතු නිලධාරින් හට සිදුව ඇති අලාභය පෞද්ගලිකව දැරීමට සිදු වන බව කාරුණිකව දන්වා සිටිමි.

07. එමෙන්ම කිසියම් හෝ අවස්ථාවක ඉහත උපදෙස් අනුගමනය කිරීමට යාමේදී මතු වන ප්‍රායෝගික දුෂ්කරතාවයන් ඇත්නම් ඒ සම්බන්ධව ප්‍රධාන කාර්යාලයෙහි ක්ෂුද්‍රමූල්‍ය අංශය දැනුවත් කර අවශ්‍ය අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කර තිබිය යුතු බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

**සී.ඩී කළුආරච්චි**
**අධ්‍යක්ෂ ජනරාල්**

**පිටපත්:-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරි,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.